# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2051/10 – 2017 දෙසැම්බර් 26 වැනි අඟහරුවාදා – 2017.12.26**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/15/31/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. ඒ. එන්. ප්‍රියදර්ශනී මෙනවිය, අංක 59/ඒ7, නාගහවත්ත පාර, බණ්ඩාරවත්ත, ගම්පහ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, හෙද පුහුණු පාසල, විදුහල්පති නිල නිවස, එල්. ආර්. සුමතිපාල මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/31/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. ඒ. එන්. ප්‍රියදර්ශනී මෙනවිය, අංක 59/ඒ 7, නාගහවත්ත පාර, බණ්ඩාරවත්ත, ගම්පහ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

1993.12.01 වන දින සිට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ කාර්මික නිලධාරිනියක් ලෙස සේවය කළ එස්. ඒ. එන්. ප්‍රියදර්ශනී මෙනෙවියට එම අංශයේදී සිදුවූ ගැටළු නිසා වාචිකව සිවිල් අංශයට මාරු කළ ද විසඳුමක් නොදීමෙන් ඇති වූ මානසික ගැටළු හේතුවෙන් ඇය එකඟ නොවූ වන්දි මුදලක් ගෙවා වෛද්‍ය නිර්දේශ මත සේවය අවසන් කිරීමෙන් ඇයට අසාධාරණයක් සිදුව තිබේ ද ? එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 දෙසැම්බර් මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

01 - 268

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.